# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## සේවක පුරප්පාඩු

**01. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2)** **- තනතුරු 02**

තනතුරේ ස්වභාවය :- ස්ථිර

**මූලික සුදුසුකම් (බාහිර අයදුම්කරුවන් සඳහා) :-**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ එකවර විෂයයන් හයක් (06) සමත් වීම (පළමු භාෂාව, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව එක් වරකදී සම්මාන සාමාර්ථ හතරක් (04) සහිතව)

සහ

- අ.පො.ස. උසස් පෙළ විෂයයන් තුනක් (03) සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් පහත දක්වා ඇත.

**02. විගණන සහකාර (MA 1-2)** **- තනතුරු 01**

තනතුරේ ස්වභාවය :- ස්ථිර

**මූලික සුදුසුකම් (බාහිර අයදුම්කරුවන් සඳහා) :-**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ එකවර විෂයයන් හයක් (06) සමත් වීම (පළමු භාෂාව, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව එක් වරකදී සම්මාන සාමාර්ථ හතරක් (04) සහිතව)

සහ

- අ.පො.ස. උසස් පෙළ විෂයයන් තුනක් (03) සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**ඉහත මූලික සුදුසුකම් වලට අමතරව පහත සුදුසුකම් සහිත අයවලුන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.**

- අ.පො.ස. උසස් පෙළ සඳහා වානිජ විෂය ධාරාව හදාරා තිබීම.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (Charted Accountants of Sri Lanka) පදනම්/සහතික පත්‍ර 1 මට්ටම (Foundation Level/ Certificate Level 1) සමත් වී තිබීම.

හෝ

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්ප ආයතනය (AAT) අවසන් වසර සමත්වීම සහ රාජ්‍ය දෙපාර්තමේන්තුවක/සංස්ථාවක /මණ්ඩලයක හෝ පිළිගත් වෙනත් ආයතනයක මූල්‍ය /විගණන ක්ෂේත්‍රයේ වසර 01 ක අවම පළපුරුද්ද සහිත වීම.

**ඉහත 01 හා 02 තනතුරු සඳහා "අභ්‍යන්තර අයදුම්කරුවන්" සඳහා සුදුසුකම් :-**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාථමික තලයේ නුපුහුණු (PL 1), අර්ධ පුහුණු (PL 2) හෝ පුහුණු (PL 3) කාණ්ඩයේ අයවලුන් හට පහත සඳහන් සුදුසුකම් සතුවේ නම් අයදුම් කළ හැකිය.

- අ.පො.ස. සාමාන්‍ය පෙළ එකවර විෂයයන් හයක් (06) සමත් වීම (පළමු භාෂාව, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව එක් වරකදී සම්මාන සාමාර්ථ හතරක් (04) සහිතව)

සහ

- ඉහත සේවක වර්ගීකරණය යටතේ දක්වා ඇති ප්‍රාථමික ශ්‍රේණියේ PL 1, PL 2 හෝ PL 3 ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත 01 සහ 02 තනතුරු සඳහා පොදු වැටුප් විස්තර**

වැටුප් පරිමාණය :- කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 අනුව 2018.01.01 දින සිට
මූලික වැටුප රු. 22,126.00 + රජයේ අනුමත අනෙකුත් දීමනා

## 03. ක්ෂේත්‍ර හා කාර්යාල/රසායනාගාර සහායක (PL 1) - තනතුරු 02

තනතුරේ ස්වභාවය :- ස්ථිර

**මූලික සුදුසුකම්:-**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ අවම වශයෙන් විෂයයන් දෙකක් (02) සමත් වීම

  සහ

- මහන්සි වී වැඩ කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත වීම

වැටුප් පරිමාණය :- කළමණාකරණ සේවා චක්‍රලේඛ 2/2016 අනුව 2018.01.01 දින සිට
මූලික වැටුප රු. 19,622.00 + රජයේ අනුමත අනෙකුත් දීමනා

**ඉහත 01,02 හා 03 සියලු තනතුරු සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරා තිබිය යුතුය;**

1. සියලු අයදුම්කරුවන් වයස අවුරුදු 18 - 45 අතර විය යුතුය (උපරිම වයස අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

2. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ඉහත සියලු තනතුරු සඳහා,

- සේවක අර්ථසාධක අරමුදල (EPF) - ආයතනයෙන් 15% , සේවකයාගෙන් 10%
- සේවක භාරකාර අරමුදල (ETF) - ආයතනයෙන් 3%

**අයදුම් කළ යුතු ආකාරය :-**

**මේ සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් තමන් පිළිබඳ විස්තර ඇතුළත් ජීව දත්ත සටහනක් ඔබගේ අධ්‍යාපනික සහතිකවල පිටපත්ද සහිතව, තොරතුරු දැන ගැනීම සඳහා ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තරද ඇතුළත්ව අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් පස කෙලවරේ සඳහන් කොට අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

# අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: 2018-06-18

සභාපති,
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය,
නො.73/5/A ,"රුවන් සෙවන",ලෝ ලෙවල් පාර,
වැලිවිට, කඩුවෙල.
දුරකථන : 0112-579 180
ෆැක්ස් : 0112-579 182